මගේ අංකය - සිආදෙ/3/5/2 –I

චක්‍රලේඛ අංක -10/2016

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
බම්බලපිටිය.

2016.11.30

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
සියළුම අධ්‍යක්ෂවරුන් / නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් / සහකාර අධ්‍යක්ෂවරුන්,
මූලස්ථාන මාණ්ඩලික නිලධාරී,
සියළුම බලකා අණදෙන නිලධාරීන් / පුහුණු පාසල් අණදෙන නිලධාරීන්,
සහ ව්‍යාපෘති භාර නිලධාරීන්

<u>සිවිල් ආරක්ෂක සාමාජිකයින් සඳහා නව නිල අංක ලබා දීම</u>

මෙම දෙපාර්තමේන්තු සාමාජික / සාමාජිකාවන් මුල් බඳවා ගැනීම් සිදු කිරීමේ දී එකම නිල අංකය සාමාජිකයින් කිහිපදෙනෙකුට නිකුත් කිරීමත්, නිළ උසස්වීම්හි දී විවිධ නිල අංක ලබාදීමත් හේතුවෙන් ඇතිවී තිබෙන ගැටළු සහගත තත්වය මගහරවා ගැනීම සඳහා දැනට රාජකාරියේ යෙදී සිටින සියලු සාමාජික / සාමාජිකාවන් වෙනුවෙන් නව නිල අංක ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ.

02. 2015.04.23 දින වන විට මෙම දෙපාර්තමේන්තු සාමාජික / සාමාජිකාවන් හට ස්ථිර පත්වීම් ලබා දුන් නාම ලේඛනයට අනුව පහත ක්‍රමවේදය පරිදි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ DMS/1186 හා 2014.02.28 දිනැති ලිපිය මඟින් අනුමත කරන ලද තනතුරු සඳහා නව නිල අංක නිකුත් කිරීම සිදු වේ. (අදාල මෑදු පිටපත මේ සමග අමුණා ඇත.)

1. දිස්ත්‍රික් නිලධාරී / නිලධාරිනියන් සඳහා 0/001 සිට ඉදිරියට
2. සාමාජිකයන් සඳහා M අක්ෂරය ද, සාමාජිකාවන් සඳහා F අක්ෂරය ද, සහිතව අනුපිළිවෙලින් 000001 සිට ඉදිරියට

03. මීට අදාලව උක්ත සඳහන් පරිදි දෙපාර්තමේන්තු සියළුම සාමාජික / සාමාජිකාවන් සඳහා ඉදිරියේ දී නිල අංක ලබා දීම සිදු කල යුතු අතර, එමගින් පැරණි නිල අංක මගින් සිදු කළ කිසිදු පරිපාලන කටයුත්තක් බල රහිත වීමක් හෝ දෙපාර්තමේන්තු සාමාජික / සාමාජිකාවන්ට කිසිදු අගතියක් හෝ සිදු නොවිය යුතු බවත්, අදාල අංක ක්‍රමය 2016.12.01 දින සිට ඉදිරියට ක්‍රියාත්මක විය යුතු බවත් මින් දන්වා සිටිමි.

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්ෂ ජනරාල්

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්ෂ ජනරාල්
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව